ගෘහස්ථ හිංසනය යනු ශ්‍රී ලාංකික සන්දර්භය තුළ කතිකාවට ලක් විය යුතු ගැටළුවක් බැව් නොකිවමනායි. ඒ අනුව, මැයි 01, 2022 දින ඉරිදා ලංකාදීප පුවත්පතේ පළවූ, "දින දින වැඩිවෙන ගෘහස්ථ හිංසන" යන මැයෙන් යුතු ලිපියක, මෑත කාලයේදී කාන්තාවන්ට එරෙහිව සිදුවන හිංසනය සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වර්ධනය වී ඇති බව, අදාළ දත්ත සමඟින් පෙන්වා දී ඇත.

ගෘහස්ථ හිංසනය යන සමාජ ගැටලුව පිළිබඳව සමාජ දැනුවත්භාවයක් ඇති කිරීමට දායක වන මෙම ලිපිය සමඟින්, කාන්තාවන් සඳහා හදිසි උපකාරක දුරකතන අංක ද පළ කර තිබීම සැබවින්ම ප්‍රශංසනීය වේ. එය, එවැනි ගැටලුවක් අත්විඳින අයෙකුට උපකාර සඳහා ළඟා වීමට ද මනා පිටුවහලක් වනු ඇත.

කාන්තා උපකාරක දුරකතන සේවය: 1938
මිතුරු පියස ක්ෂණික ඇමතුම්: 070 26 11 111